ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය, ඩුබායි — යොමු අංකය 1920-004

2019 සැප්තැම්බර් 25

**<u>වාර්ෂික මහා සභා රැස්වීම 2019-2020</u>**

දයාබර දෙමාපියන් වෙත,

නව අධ්‍යයන වසරේ දහම් පාසල් වාර්ෂික මහා සභා රැස්වීම **2019 සැප්තැම්බර් 28 වැනිදා සෙනසුරාදා පෙ. ව. 9:00-12:00** දක්වා දහම් පාසල් ශාලාවේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

අපගේ දූදරුවන් යහපත් ගුණගරුක පුරවැසියන් ලෙස සමාජයට, මවුබිමට දායද කිරීම සඳහා අපමණ වෙහෙසක් දරා පවත්වාගෙන යන මෙම ජාතික මෙහෙවරින් උපරිම ප්‍රයෝජන ලබා දීමට දෙමාපියන් ලෙසට ඔබගෙන් ලැබෙන දායකත්වය අප ඉතා අගය කර සිටිමු. අප දූදරුවන්ට හොඳ දහම්පාසල් අධ්‍යාපනයක් ලබාදී ඔවුනගේ ආධ්‍යාත්මික, සමාජීය වටිනාකම් වැඩි දියුණු කිරීමෙහිලා දෙමව්පියන් වන ඔබගේ සහයෝගය කුමන ආකාරයකින් වියයුතුද, ඒ සඳහා දහම් පාසල් වැඩකටයුතු සාර්ථක කරගන්නේ කෙසේද යන කරුණු සාකච්ඡා කර විධිමත් ලෙසට සැලසුම් සම්පාදනය කිරීම මෙම රැස්වීමේ මූලික අභිප්‍රායයි. එබැවින් මෙම රැස්වීමට සහභාගී වීම ඔබගේ වගකීමක් බව කරුණාවෙන් සලකන්න.

මෙම රැස්වීම සඳහා උදේ වරුවේ සහ දහවල් වරුවේ පන්ති වලට සහභාගී වන සියලුම දරුවන්ගේ දෙමාපියන් වෙත ආරාධනය කර සිටින අතර ඔබ සැමගේ සහභාගීත්වය අත්‍යවශ්‍ය බව නැවතත් අවධාරණය කර සිටිමු.

නව අධ්‍යයන වසරේ 1 වසර සඳහා දරුවන් ඇතුලත් කල දෙමාපියන් හට මෙම රැස්වීමට සහභාගී වීම අනිවාර්ය බව කරුණාවෙන් සලකන්න.

කරුණාකර දරුවාගේ ශිෂ්‍ය වාර්තා පොත රැගෙනවිත් එහි ඔබගේ පැමිණීම සනිටුහන් කරගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

**සැ.යු.: මෙම වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීමට සහභාගී වන ඔබ සැම දහම් පාසලේ දැනට ක්‍රියාත්මක වන වාහන නැවැත්වීමේ ප්‍රතිපත්තිය අනුගමනය කිරීමට කාරුණික වන මෙන් මතක්කර සිටිමු.**

ස්තුතියි,

සංවිධායක මණ්ඩලය